*සැ. යු.-* මෙම ගැසට් පත්‍රයේ VI කොටසේ 2016 වර්ෂය සඳහා පානදුර අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,977 - 2016 ජූලි මස 22 වැනි සිකුරාදා - 2016.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1284 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1308 |


*සැ. යු.-* දොස්තර සමන් වීරසිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මැයි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අගෝස්තු මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජූලි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1281- B 81079— 5,403 (2016/07)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1\. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2\. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3\. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4\. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5\. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6\. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7\. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8\. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9\. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10\. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11\. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12\. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13\. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14\. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15\. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16\. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම්කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 අගෝස්තු මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 04 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | බිංගිරිය | කුරුණෑගල දිස්ත්‍රික්/කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ කරදපත්තුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |

07-828

## නීතිපති දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ (නීති නිලධාරි සේවා ගණයේ) තනතුර සඳහා බඳවා ගැනීම

නීතිපති දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුරු පුරප්පාඩු දොළහක් (12) පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :- නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ප්‍රථම ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයෙන් ලකුණු 50 ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවනු ලැබේ. අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා සේවා අවශ්‍යතාවය මත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 05 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් :
ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිව්රුම් දී තිබීම සහ නොතාරිස් ආඥා පනත යටතේ නිකුත් කරන ලද වලංගු නොතාරිස් බලපත්‍රයක් තිබීම.

(ii) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතුය.

(iii) වෙනත් :
* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
* විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
* ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවෙකු වී නොතිබිය යුතුය.
* අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

(ii) පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, මෙම පත්වීම යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.58,295-5x1,335-5x1,630-15x2,170-රු. 105,670/- (SL-05-2016) වේ.

ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. (උදා: 2016.01.01 දින සිට 2016.12.31 දක්වා අදාළ වනුයේ රු.34,135/- ක මූලික වැටුපක් හා රු. 9,579/- ක ගැලපුම් දීමනාවකි).

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ. :-

| *කරුණ* | *උපරිම ලකුණු* | *විස්තරය* | *ලකුණු* |
|---|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 20 | (i) රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලය මගින් පිරිනමන අදාළ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්. | ලකුණු 08 |
| | | (ii) රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) පළමු පෙළ සාමාර්ථය. | ලකුණු 07 |
| | | (iii) රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ ඉහළ සාමාර්ථය. | ලකුණු 06 |
| | | (iv) රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ පහළ සාමාර්ථය. | ලකුණු 05 |
| | | (v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ ගෞරව සාමාර්ථය. | ලකුණු 08 |
| | | (vi) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ ගෞරව සාමාර්ථය. | ලකුණු 05 |
| | | රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක් යනු, සංස්ථාපිත නීති අධ්‍යාපන සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් වේ. | |
| | | (ඉහත සඳහන් සියළුම කුසලතාවන් උපරිම ලකුණු 20 කට සීමා වේ.) | |
| | | * ඉහත අධ්‍යාපන සුදුසුකම් සහතික මගින් සනාථ කළ යුතුය. | |
| ලේඛනගත නීතිඥවරයෙකු ලෙස ලබා ඇති වෘත්තිය පළපුරුද්ද | ලකුණු 20 | (i) ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීම. (එක් අවුරුද්දක් සඳහා ලකුණු 02 බැගින්) | ලකුණු 10 |
| | | (ii) රජයේ හෝ පිළිගත් නීති ආයතනයක ලේඛනගත නීතිඥවරයෙකු ලෙස සක්‍රීයව හා සාර්ථකව කටයුතු කර තිබීමෙන් දක්වන ලද කුසලතා (ඉහත සඳහන් කුසලතා සඳහා සහතික ඉදිරිපත් කළ යුතුය.) | ලකුණු 10 |
| | | *සටහන* : විනිශ්චයකාරවරයෙකුගෙන් වෘත්තිය හැකියාව පිළිබඳ සහතිකයක් සහ අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරුන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය. නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් නිකුත් කරන ලද චරිත සහතික අදාළ නොවේ. | |

| *කරුණ* | *උපරිම ලකුණු* | *විස්තරය* | *ලකුණු* |
|---|---|---|---|
| විශේෂ දක්ෂතා | ලකුණු 50 | (i) සන්නිවේදන කුසලතාවය | ලකුණු 12.5 |
| | | (ii) හිටිවන කථිකත්වයේ කුසලතාවය | ලකුණු 12.5 |
| | | (iii) සභාව ඉදිරියේ සාර්ථකව පෙනී සිටීමේ කුසලතාවය | ලකුණු 12.5 |
| | | (iv) භාෂාව හැසිරවීමේ හැකියාව | ලකුණු 12.5 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | ලකුණු 10 | (i) පෞරුෂත්වය | ලකුණු 05 |
| | | (ii) නායකත්ව ගුණාංග | ලකුණු 05 |

අවසාන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| (i) තර්ක ශක්තිය | ලකුණු 25 |
| (ii) කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව | ලකුණු 25 |
| (iii) ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව | ලකුණු 25 |
| (iv) මූලික නෛතික සිද්ධාන්ත දැනුම | ලකුණු 25 |
| එකතුව | ලකුණු 100 |

06. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

07. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) කොළඹ 12. නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන අංශයෙන් අයදුම්පත් ලබාගත හැකි අතර, 2016.08.31 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, තැ. පෙ. 502, කොළඹ 12" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. 2016.08.31 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

08. සාවද්‍ය තොරතුරු සැපයීම :-

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

09. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

10. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

නීතිපති.

2016 ජූලි මස 08 වැනි දින,

උපරිමාධිකරණ සංකීර්ණය,
නීතිපති දෙපාර්තමේන්තුව.
කොළඹ 12.

07-955

---

**අධිකරණ අමාත්‍යාංශය**

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ (හදිසි) මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශවල පුරප්පාඩුවී ඇති හදිසි මරණ පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර ''ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය , කොළඹ 12" වෙත 2016.08.22 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ''(හදිසි) මරණ පරීක්ෂක තනතුර - ......... දිස්ත්‍රික්කය'' යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවේ. මෙම තනතුරට පත් කරනු ලබන දින සිට වසර පහකට බලපවත්වන පරිදි පත් කරනු ලබන අතර, ඉන් පසුව අදාළ ප්‍රදේශයේ මහෙස්ත්‍රාත්තුමාගේ හා පොලිස් ස්ථානාධිපතිගේ නිර්දේශයන් සහ වෛද්‍ය නිර්දේශ සලකා බලා සේවය දීර්ඝ කරනු ලැබිය හැකිය. එම තනතුර දැරීමේ උපරිම වයස් සීමාව අවුරුදු 70 නොඉක්ම විය යුතුය. එහෙත් ඉන් පෙර ඕනෑම අවස්ථාවක (හදිසි) මරණ පරීක්ෂකවරයෙකු හේතු දක්වා අමාත්‍යවරයා විසින් සේවයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. පත්වීම් දෙනු ලබන පුරප්පාඩු වී ඇති (හදිසි) මරණ පරීක්ෂක කොට්ඨාස පහත උපලේඛනයේ සඳහන් වේ.

04. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව (හදිසි) මරණ පරීක්ෂකවරුන්ගේ කාර්යයන් පත්වීම් ලාභීන් විසින් ඉටුකළ යුතු වේ.

05. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එසේ වුව ද මරණ පරීක්ෂණයක් සඳහා රු. 500/- ක ගාස්තුවක් ද, මරණ පරීක්ෂකවරුන් සඳහා අනුමත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ද ගෙවනු ලැබේ.

06. පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති අයවලුන්ට පමණක් අයදුම් කළ හැක.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(ආ) පත්වීම අපේක්ෂා කරන ප්‍රදේශයේ පසුගිය වසර දෙක තුළ ස්ථිර පදිංචිකරුවකුව සිටීම.
(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය.
(ඈ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් 03 කින් සාමාර්ථය ලබා තිබීම.
(මෙහිදී විද්‍යා විෂයයන්ගෙන් සාමාර්ථය ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ)
(ඉ) හදිසි මරණ පරීක්ෂණ තනතුර (මුස්ලිම්) සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්ට දෙමළ භාෂාවෙන් කතා කිරීමේ හා ලිවීමේ හැකියාව තිබිය යුතු ය.
(ඊ) මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍යය. තත්ත්වයකින් හෙබි අයෙකු විය යුතුය. මත්පැන් පාවිච්චියෙන් සහ දුම්පානයෙන් තොර තැනැත්තන් සඳහා ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.

07. අයදුම්පත් භාරගන්නා අවසන් දින වනවිට රජයේ, පළාත් සභා අරමුදලකින් හෝ පළාත් පාලන ආයතනයක අරමුදලකින් වැටුපක් හෝ දීමනාවක් ලබන තැනැත්තන් ද, රාජ්‍ය සංස්ථාවල සහ සමුපකාර සමිතිවල සේවකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද, පළාත් සභා මන්ත්‍රීවරුන් හෝ පළාත් පාලන ආයතනවල සභිකයන් ද මෙම තනතුර සඳහා අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

08. ඉල්ලුම්පත්‍රය සමඟ කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය. එසේ වුව ද සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් සියලුම සුදුසුකම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර, පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) ජාතික හැඳුනුම්පත
(ඈ) ස්ථිර පදිංචිය සනාථ කෙරෙන ග්‍රාම නිලධාරි සහතිකය
(ඉ) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්
(ඊ) අතිරේක සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඇති වෙනත් සහතික තිබේ නම් එම සහතික
(උ) විශ්‍රාමික අයදුම්කරුවන් විසින් විශ්‍රාම ගත් දිනය සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි

09. සියලුම අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතියට අනුකූලව පැහැදිලි අකුරින් සම්පූර්ණ කර තිබිය යුතුය. අවශ්‍ය තොරතුරු සියල්ල ඇතුළත් නොකර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ඉල්ලුම්පත් ආකෘති පිරවීමේ දී යෝග්‍යතා නිර්ණායක පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් කළ යුතු ය. ඉහත 07 වන ඡේදයේ සඳහන් ගණයකට අයත් හෝ අංක 06 හෝ 08 යන ඡේද සඳහා අසත්‍ය තොරතුරු සපයන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගෙන පත්වීම් දීමෙන් අනතුරුව සත්‍ය තත්ත්වය ඔප්පු වුවහොත් එබඳු අයදුම්කරුවන්ගේ පත්වීම් වහාම අවලංගු කරනු ලැබේ.

11. තව ද හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් පත්කරනු ලැබීමෙන් පසුව ඉහත 07 ඡේදයේ තනතුරකට පත්වුවහොත් එසේ පත්වීම ලද දින සිට මෙකී පත්වීම අහෝසි වේ.

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

2016 ජූනි මස 30 වන දින.
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

**හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා ආදර්ශ අයදුම් පත්‍රය**

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |
| අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය | | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | |
| අදාළ පොලිස් ස්ථානය | | පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය | |

01. (*අ*) මුලකුරු සමඟ නම (පැහැදිලි අකුරෙන්) :————.
(පෙලපත් නාමය යටින් ඉරක් අඳින්න)

(*ආ*) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

02. ලිපිනය :————.

03. දුරකථන අංකය :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. උපන් දිනය :————.

06. 2016.08.22 දිනට වයස : අවු :————. මාස :————. දින :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

08. අධ්‍යාපන සුදුසුකම් ඃ

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* | *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගය ඃ

| *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* | *විෂයය* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් :———.

10. වර්තමාන රැකියාව :———.

11. කලින් කරන ලද රැකියාව :———.

12. (අ) රජයේ/රාජ්‍ය සංස්ථාවක/පළාත් සභාවක, සමූපකාර හෝ පළාත් පාලන ආයතනයක රැකියාවක් කරන්නේද? :——.
(ආ) එවැනි සේවයකින් අස්වී/විශ්‍රාම ගොස් ඇත්නම්, අස්වීමට/විශ්‍රාම යාමට හේතුව :———.
(ඇ) අස්වීම/විශ්‍රාම යාම අනුමත කළ දිනය :———.

13. (අ) ඔබට විරුද්ධව කිසියම් කලක සේවා යෝජකයා විසින් විනයානුකූලව කටයුතු කර තිබේද? :———.

(ආ) එසේ නම්, චෝදනාවේ ස්වභාවය හා ප්‍රතිඵලය :———.

14. (අ) (i) යම්කිසි වරදකට කෙදිනකදී හෝ ඔබට විරුද්ධව උසාවියේ නඩුවක් පවරා තිබුණේද? :———.

(ii) ඔබ ද හවුල් වූ ආරවුලක් සමථකරණය කිරීම සඳහා කෙදිනකදී හෝ සමථ මණ්ඩලයකට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණේද? :———.

(ආ) එසේ නම් එහි ප්‍රතිඵලය :———.

15. (අ) දැනට (හදිසි) මරණ පරීක්ෂක තනතුරක් දරන්නේද? :———.
(ආ) එසේ නම්, පළමු පත්වීම ලැබූ දිනය හා අමාත්‍යාංශයේ ගොනු අංකය :———.

16. මෙම තනතුර සඳහා අදාළ වෙනත් සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :———.

17. චරිත සහතික දෙන පුද්ගලයන් දෙදෙනාගේ නම්, ලිපිනයන් හා පදවි නාම :———.

(i) ———.

(ii) ———.

ම' විසින් ඉහත සඳහන් කර ඇති කරුණු සියල්ලම සම්පූර්ණයෙන්ම සත්‍ය බව හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

**මාතර දිස්ත්‍රික්කය**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය* | |
|---|---|---|---|
| දෙවිනුවර | දෙවිනුවර | දෙවිනුවර උතුර | 432 |
| | | දෙවිනුවර මධ්‍යම | 432 ඒ |
| | | දෙවිනුවර දකුණ | 433 |
| | | දෙවිනුවර බටහිර | 433 ඒ |
| | | දෙවිනුවර නැගෙනහිර | 433 බී |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය* | |
|---|---|---|---|
| දෙවිනුවර *(සම්බන්ධිතයි)* | දෙවිනුවර | දෙවිනුවර | 433 සී |
| | | දෙවිනුවර නුගේගොඩ | 433 ඩී |
| | | දෙවිනුවර වව්ව | 433 ඊ |
| | | දෙවිනුවර සිංහාසනපෙදෙස | 433 එෆ් |
| | | දෙවිනුවර වෙලේගොඩ | 433 ජී |
| | | දෙවිනුවර ප්‍රදීපාගාර | 433 එච් |
| | | කපුගම බටහිර | 435 |
| | | ගන්දරාවත්ත දකුණ | 435 ඒ |
| | | කපුගම නැගෙනහිර | 436 |
| | | දෙල්ගල්ල | 436 ඒ |
| | | කපුගම උතුර | 436 බී |
| | | කපුගම මධ්‍යම | 436 සී |
| | | ගන්දර බටහිර | 437 |
| | | ගන්දර නැගෙනහිර | 437 ඒ |
| | | ගන්දර දකුණ | 437 බී |
| | | ගන්දර මධ්‍යම | 437 සී |
| | | තලල්ල දකුණ | 438 |
| | | තලල්ල මධ්‍යම | 438 ඒ |
| | | තලල්ල නැගෙනහිර | 438 බී |
| | | තලල්ල | 438 සී |
| | | තලල්ල උතුර | 439 |
| | | නාඹටුන්න | 442 |
| | | නාඹටුන්න මධ්‍යම | 442 ඒ |
| | | නාඹටුන්න දකුණ | 442 බී |
| | | නාඹටුන්න උතුර | 442 සී |
| කොටපොල | පල්ලේගම | පල්ලෙගම උතුර | 241 |
| | | කිරිවැල්දොළ | 241 ඒ |
| | | පල්ලෙගම දකුණ | 241 බී |
| | | පාතවල නාදකන්ද | 241 ඩී |
| | | නිශ්ශංකපුර | 241 ඊ |
| | | කිරිවලගම | 241 ජී |
| | දෙනියාය | බටේයාය | 241 සී |
| | | කන්දිල්පාන | 241 එච් |
| | | දෙනියාය | 243 |
| | | දෙනියාය බටහිර | 243 ඒ |
| | | ඉහලගම | 243 බී |
| | | විහාරහේන | 244 |
| | | තැනිපිට | 244 ඒ |
| | | කළුගලහේන | 244 බී |
| | | අඩාරදෙනිය | 244 සී |
| වැලිගම | වැලිගම ග්‍රාමීය | මුදුගමුව නැගෙනහිර | 378 |
| | | මුදුගමුව බටහිර | 378 බී |
| | | පාතේගම | 379 |
| | | පිට්දූව | 379 ඒ |
| | | වලාන | 379 බී |
| | | මිදිගම නැගෙනහිර | 380 |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංක* | |
|---|---|---|---|
| වැලිගම *(සම්බන්ධිතයි)* | වැලිගම ග්‍රාමීය | ගුරුබැබිල | 380 ඒ |
| | | මිදිගම බටහිර | 381 |
| | | මිදිගම උතුර | 381 ඒ |
| | | වැකඩ | 381 බී |
| | | දේනුවල | 381 සී |
| | මිරිස්ස | පැලෑන දකුණ | 387 බී |
| | | පැලෑන උතුර | 387 සී |
| | | පොල්වත්ත | 388 |
| | | පොල්වතුමෝදර | 388 ඒ |
| | | නිදන්ගල | 399 ඒ |
| | | කොටවිල දකුණ | 404 |
| | | කොටවිල උතුර | 404 ඒ |
| | | කොටවිල බටහිර | 404 බී |
| | | මිරිස්ස උතුර | 405 |
| | | මිරිස්ස උඩුපිල | 405 ඒ |
| | | මිරිස්ස උඩුමුල්ල | 405 බී |
| | | හේන්වල නැගෙනහිර | 405 සී |
| | | හේන්වල බටහිර | 405 ඩී |
| | | මිරිස්ස දකුණ I | 406 |
| | | මිරිස්ස දකුණ II | 406 ඒ |
| | | තල්අරඹ දකුණ | 407 |
| | | බණ්ඩරමුල්ල | 407 ඒ |
| | | තල්අරඹ උතුර | 407 බී |
| | | තල්අරඹ නැගෙනහිර | 407 සී |
| | | කඹුරුගමුව උතුර | 408 |
| | | කඹුරුගමුව බටහිර | 408 ඒ |
| | | ගරාඩුව | 408 බී |
| | | කඹුරුගමුව දකුණ | 408 සී |
| | | තුඩැල්ල | 408 ඩී |
| හක්මණ | උඩුපීල්ලගොඩ | පනන්වෙල බටහිර | 282 |
| | | පනන්වෙල නැගෙනහිර | 282 ඒ |
| | | වේපතඉර උතුර | 283 |
| | | වේපතඉර දකුණ | 283 ඒ |
| | | කැබිලියපොල උතුර | 284 |
| | | කැබිලියපොල දකුණ | 284 ඒ |
| | | ගංගොඩගම | 286 |
| | | පොත්තේවෙල | 286 ඒ |
| | | කොහුලියද්ද | 286 බී |
| | | ගම්මැදපිටිය | 286 සී |
| | | උඩුපීල්ලගොඩ නැගෙනහිර | 294 |
| | | උඩුපීල්ලගොඩ බටහිර | 294 ඒ |
| | | ලාල්පේ | 294 බී |
| | | කෝංගල නැගෙනහිර | 295 |
| | | කෝංගල දකුණ | 295 සී |
| තිහගොඩ | වටගෙදර | නාදුගල I | 337 |
| | | වටගෙදර | 337 ඒ |
| | | නාදුගල II | 337 බී |
| | | වටගෙදර නැගෙනහිර | 337 සී |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංක* | |
|---|---|---|---|
| තිහගොඩ *(සම්බන්ධිතයි)* | වටගෙදර | පාලටුව | 340 |
| | | උනැල්ල | 340 ඒ |
| | | එළඹතලාගොඩ | 340 බී |
| | | දෙමටහෙට්ටිගොඩ | 340 සී |
| | | ඇත්තුඩාව | 341 |
| | | ඇත්තුඩාව - බටහිර | 341 ඒ |
| අතුරලිය | බෝපගොඩ | ඌරුමුත්ත | 304 |
| | | කෙහෙල්වල | 304 ඒ |
| | | ඌරුමුත්ත - දකුණ | 304 බී |
| | | වැලිහේන | 305 |
| | | දිවිතුර | 305 ඒ |
| | | දෙමටපාස්ස | 305 බී |
| | | තලමහගම - නැගෙනහිර | 306 |
| | | තලමහගම - බටහිර | 306 ඒ |
| | | වේනගම | 306 බී |
| | තිබ්බොටුවාව | හව්පෙ | 306 සී |
| | | පානදුගම | 308 |
| | | ගොඩපිටිය | 308 ඒ |
| | | කනහලගම | 308 බී |
| | | මාරගොඩ | 308 සී |
| අකුරැස්ස | අකුරැස්ස අංක 01 | පරදූව - උතුර | 359 |
| | | පරදූව - දකුණ | 359 ඒ |
| | | පරදූව - නැගෙනහිර | 359 බී |
| | | මැලැව්ව | 359 සී |
| | | අකුරැස්ස | 360 |
| | | යකාබැද්ද | 360 ඒ |
| | | ඉහළ කියාඩුව | 360 බී |
| | | ගලබඩහේන | 360 සී |
| | | පෝරඹ | 361 ඒ |
| | | ඉලුපැල්ල | 361 බී |
| | | ඉඹුල්ගොඩ | 361 සී |
| | | ගංහැල | 362 |
| | | මිනිපෝගොඩ | 362 ඒ |
| | | අස්මගොඩ | 362 බී |
| | | මාරඹ - දකුණ | 363 |
| | | මාරඹ - උතුර | 363 ඒ |
| | | ලේනම - දකුණ | 363 බී |
| | | පෙද්දපිටිය - දකුණ | 363 සී |
| | | පෙද්දපිටිය - උතුර | 363 ඩී |
| | | හුලංදාව | 363 ඊ |
| | | ලේනම - උතුර | 363 එෆ් |
| | | උඳුපිටිය | 363 ජී |
| | | ඉඳිකටුදෙණිය | 363 එච් |
| | | දියලපේ | 364 |
| | | හිග්ගොඩ | 364 ඒ |
| | | එරමුදුගොඩ | 365 |
| | | මාණික්ගොඩ | 365 ඒ |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංක* | |
|---|---|---|---|
| අකුරැස්ස *(සම්බන්ධිතයි)* | | කැටන්විල | 366 |
| | | හේනේගම | 370 |
| | | හේනේගම - බටහිර | 370 ඒ |
| | | පරගහවත්ත | 370 බී |
| | | නිමලව | 371 |
| | | ගල්ලල | 371 ඒ |
| | | නිමලව - නැගෙනහිර | 371 බී |
| පස්ගොඩ | ඌරුබොක්ක | ගින්නලිය - නැගෙනහිර | 246 |
| | | ගින්නලිය - බටහිර | 246 බී |
| | | ගින්නලිය - උතුර | 246 සී |
| | | ගින්නලිය - දකුණ | 246 ඩී |
| | | කිරිපිටිය - නැගෙනහිර | 249 |
| | | ඌරුබොක්ක | 249 ඒ |
| | | මැකිලියතැන්න | 249 බී |
| | | හීගොඩ | 249 සී |
| | | කිරිපිටිය බටහිර | 249 ඩී |
| | | දම්පහල - නැගෙනහිර | 253 |
| | | දම්පහල - බටහිර | 253 ඒ |
| | | හුලන්කන්ද | 253 බී |
| | බෙරලපනාතර | කැටවල | 246 ඒ |
| | | පට්ටිගල | 246 ඊ |
| | | බෙරලපනාතර - උතුර | 250 |
| | | බෙරලපනාතර - දකුණ | 250 ඒ |
| | | කැකුන්දෙනිය | 250 බී |
| | | තලපලකන්ද | 250 සී |
| | | විජයගම | 250 ඩී |
| | | පාතවිට | 250 ඊ |
| | | කිරිලිපන | 251 |
| | | බටාදූර - උතුර | 251 ඒ |
| | | මොරගල | 251 බී |
| | | මොලොග්ගමුව - උතුර | 251 සී |
| | | මොලොග්ගමුව - දකුණ | 251 ඩී |
| | | බටාදූර දකුණ | 251 ඊ |
| මාලිම්බඩ | තෙලිජ්ජවිල | මාලිම්බඩ - උතුර | 350 |
| | | කටුවන්ගොඩ | 350 ඒ |
| | | මාලිම්බඩ - බටහිර | 351 |
| | | කිරිමැටිමුල්ල - උතුර | 351 ඒ |
| | | කිරිමැටිමුල්ල - දකුණ | 351 බී |
| | | කඩුකන්න | 353 |
| | | තෙලිජ්ජවිල | 353 ඒ |
| | | උනින්දුවෙල | 353 බී |
| | | හොරගොඩ - නැගෙනහිර | 355 |
| | | ඇල්ගිරිය | 355 ඒ |
| | | පහළ කියාඩුව | 355 බී |
| | | හොරගොඩ - බටහිර | 355 සී |
| | | හොරගොඩ - දකුණ | 355 ඩී |
| | | නාපේ | 355 ඊ |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාස | හා අංක |
|---|---|---|---|
| මාලිම්බඩ *(සම්බන්ධිතයි)* | තෙලිජ්ජවිල | දම්පැල්ල | 356 |
| | | කද්දුව | 356 ඒ |
| | | වෙළනාගොඩ | 356 බී |
| | | කැකුණවෙල | 357 |
| | | මාරගොඩ | 357 ඒ |
| | | අකුරුගොඩ නැගෙනහිර | 400 |
| | | අකුරුගොඩ බටහිර | 400 ඒ |
| | | අකුරුගොඩ දකුණ | 400 බී |
| | | අකුරුගොඩ උතුර | 400 සී |
| | | මාලිම්බඩ දකුණ | 402 |
| | | මාලිම්බඩ නැගෙනහිර | 402 ඒ |
| | | ගල්පාමුණ | 402 බී |
| | | සුල්තානාගොඩ බටහිර | 403 |
| | | සුල්තානාගොඩ දකුණ | 403 ඒ |
| | | සුල්තානාගොඩ නැගෙනහිර | 403 බී |
| වැලිපිටිය | කනංකේ | පෝරඹ කනංකේ උතුර | 372 |
| | | පෝරඹ කනංකේ දකුණ | 372 ඒ |
| | | නලවන | 372 බී |
| | | පුහුලහේන | 372 සී |
| | | වාහල කනංකේ උතුර | 373 |
| | | නිවිතිවැල්බොක්ක | 373 ඒ |
| | | වාහල කනංකේ දකුණ | 373 බී |
| | | හල්ලල | 375 |
| | | පාදිලි කොක්මාදුව | 375 ඒ |
| | | සහබන්දු කොක්මාදුව | 375 බී |
| | | කොක්මාදුව උතුර | 375 සී |
| | වැලිපිටිය | බෙරලැලිය | 375 ඩී |
| | | බතලහේන | 375 ඊ |
| | | ඉබ්බාවල | 376 |
| | | විලේගොඩ | 376 ඒ |
| | | ජම්බුරගොඩ නැගෙනහිර | 377 |
| | | පලල්ල | 377 ඒ |
| | | ජම්බුරගොඩ බටහිර | 377 බී |
| | | බොරාල | 378 ඒ |
| | | දෙනිපිටිය නැගෙනහිර | 391 |
| | | දෙනිපිටිය බටහිර | 391 ඒ |
| | | දෙනිපිටිය මධ්‍යම | 391 බී |
| | | මදුරාගොඩ | 391 සී |
| | | මූණමල්පෙ | 392 |
| | | උඩුකාව දකුණ | 392 ඒ |
| | | උඩුකාව උතුර | 392 බී |
| | | වැල්ලාන | 394 |
| | | පැනැටියන නැගෙනහිර | 394 ඒ |
| | | පැනැටියන බටහිර | 394 බී |
| | | කපුවත්ත | 396 |
| | | වැලිපිටිය | 396 ඒ |
| | | වටගෙදරමුල්ල | 397 |
| | | ඌරුවිටිය | 397 ඒ |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාස | හා අංක |
|---|---|---|---|
| වැලිපිටිය *(සම්බන්ධිතයි)* | වැලිපිටිය | මීරුප්ප | 397 බී |
| | | ජයවික්‍රමපුර | 397 සී |
| | | වරකපිටිය උතුර | 399 |
| | | වරකපිටිය දකුණ | 399 බී |
| | | වරකපිටිය නැගෙනහිර | 399 සී |
| පිටබැද්දර | දැරංගල | ගොරකවෙල | 261 |
| | | පිටබැද්දර | 261 ඒ |
| | | දැරංගල | 261 බී |
| | | කිරිවැල්කැලේ දකුණ | 261 සී |
| | | කදුරුවාන | 261 ඩී |
| | | තැන්නහේන | 261 ඊ |
| | | කිරිවැල්කැලේ උතුර | 261 එෆ් |
| | | කුඩගලහේන | 261 එච් |
| | අලපලාදෙණිය | අලපලාදෙණිය උතුර | 258 |
| | | ඊදඩුකිත නැගෙනහිර | 258 ඒ |
| | | අලපලාදෙණිය දකුණ | 258 බී |
| | | ඊදඩුකිත බටහිර | 258 සී |
| | | කළුබෝවිටියන | 259 |
| | | දංගල නැගෙනහිර | 259 ඒ |
| | | දංගල බටහිර | 259 බී |
| | | අඹේවෙල | 259 සී |
| | | ගලබඩ | 259 ඩී |
| | | බානගල නැගෙනහිර | 260 |
| | | බානගල බටහිර | 260 ඒ |
| | වැලිව | තලපෙකුඹුර | 261 ජී |
| | | වැලිව | 262 ඒ |
| | | රඹුකන නැගෙනහිර | 262 බී |
| | | කොඩිකාරගොඩ බටහිර | 262 සී |
| | | කොස්නිල්ගොඩ | 262 ඩී |
| | | අළුවන | 262 ඊ |
| | | පරදූපල්ල | 262 එෆ් |
| | | රඹුකන බටහිර | 262 ජී |
| | | කොඩිකාරගොඩ නැගෙනහිර | 262 එච් |
| | | වනසිංකන්ද | 263 එෆ් |

**ගාල්ල දිස්ත්‍රික්කය**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාස | හා අංක |
|---|---|---|---|
| හික්කඩුව | තිරාණගම හික්කඩුව | දොඩන්දූව | 51 |
| | | උඩුහල්පිටිය | 51 ඒ |
| | | මෝදර පටුවත | 52 |
| | | දොඩන්දූගොඩ | 52 ඒ |
| | | පටුවත | 53 |
| | | ගම්මඩුවත්ත | 53 ඒ |
| | | හෙන්නතොට | 53 බී |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංක* | |
|---|---|---|---|
| හික්කඩුව *(සම්බන්ධිතයි)* | | තිරාණගම | 54 |
| | | තිරාණගම වැල්ලබඩ | 54 ඒ |
| | | කටුකොලිහ | 55 |
| | | පිංකන්ද | 55 ඒ |
| | | දෙල්ගහදූව | 55 බී |
| | | හඳඋඩුමුල්ල | 55 සී |
| | | නාරිගම | 56 |
| | | නාරිගම වැල්ලබඩ | 56 ඒ |
| | | කුඩා වැවල | 56 බී |
| | | වැවල | 57 |
| | | පත්නම්ගොඩ | 57 ඒ |
| | | මිල්ලගොඩ | 57 බී |
| | | වවුලගොඩ බටහිර | 58 |
| | | වවුලගොඩ නැගෙනහිර | 58 ඒ |
| | | හික්කඩුව බටහිර | 59 |
| | | හික්කඩුව නාගරිකය | 59 ඒ |
| | | හික්කඩුව මධ්‍යම | 59 බී |
| | | නලාගස්දෙනිය | 59 සී |
| | | වැල්ලවත්ත | 59 ඩී |
| | | නාකන්ද | 59 ඊ |
| | | තොටගමුව | 61 |
| | | කලූපේ | 62 |
| | | උඩුමුල්ල | 62 ඒ |
| | | මැදගොඩ | 62 බී |
| | මහහැගොඩ | පිටිවැල්ල උතුර | 42 |
| | | පිටිවැල්ල දකුණ | 42 ඒ |
| | | කදුරුපේ | 43 |
| | | කැඳල | 43 ඒ |
| | | බූස්ස | 44 |
| | | රුජිවල | 44 ඒ |
| | | ගනේගොඩ | 44 බී |
| | | කපුමුළුගොඩ | 44 සී |
| | | රත්න උදාගම | 44 ඩී |
| | | දෝලිකන්ද | 44 ඊ |
| | | මහ හැගොඩ | 45 |
| | | මලිදූව | 45 ඒ |
| | | මැදවල | 45 බී |
| | | පාලන්ත්‍රියාගොඩ | 45 සී |
| | | හැගොඩ | 45 ඩී |
| | | රෙජ්ජිපුර | 45 ඊ |
| | මාදම්පෙ | අකුරල | 76 |
| | | අකුරල දකුණ | 76 ඒ |
| | | අකුරල උතුර | 76 බී |
| | | වේනමුල්ල | 77 |
| | | අඳුරන්ගොඩ | 77 ඒ |
| | | දිඹුල්දූව | 77 බී |
| | | කුලීගොඩ බටහිර | 78 |
| | | ගලාගොඩ නැගෙනහිර | 78 ඒ |
| | | කුලීගොඩ නැගෙනහිර | 78 බී |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | හා අංක |
|---|---|---|---|
| | | ගලාගොඩ බටහිර | 78 සී |
| | | වැල්ලබඩ | 79 |
| | | උස්මුදුලාව | 79 ඒ |
| | | ඌරවත්ත | 80 |
| | | ඉඩන්තොට | 80 ඒ |
| | | දේවගොඩ නැගෙනහිර | 80 බී |
| | | දේවගොඩ බටහිර | 80 සී |
| | | දෙල්දූව | 80 ඩී |
| | වේරගොඩ | වෙරෙල්ලන | 63 |
| | | සීනිගම බටහිර | 64 |
| | | සීනිගම | 64 ඒ |
| | | මලවැන්න | 65 |
| | | තෙල්වත්ත | 67 |
| | | පේරළිය උතුර | 67 ඒ |
| | | පේරළිය දකුණ | 67 බී |
| | | දලූවතුමුල්ල | 67 සී |
| | | කහව | 69 |
| | | ගොඩගම දකුණ | 70 |
| | | ගොඩගම උතුර | 70 ඒ |
| | | උඩුවරගොඩ දකුණ | 71 |
| | | උඩුවරගොඩ උතුර | 71 ඒ |
| | | වේරගොඩ | 72 |
| | | ගල්දූව | 72 ඒ |
| | | හරන්නගල | 72 බී |
| | | ඩෙල්මා ජනපදය | 72 සී |
| ඇල්පිටිය | අම්බන | අම්බන | 94 |
| | | පිණිකහන | 94 ඒ |
| | | වතුරුවිල | 94 සී |
| | | කහදූව | 94 ඩී |
| | | ඒරමුල්ල | 94 ඊ |
| | | රුකඩහේන | 94 එච් |
| | | තිබ්බොටුවාව | 94 ජේ |
| | | කහදූව දකුණ | 94 කේ |
| | | අම්බන උතුර | 94 එල් |
| | අමුගොඩ | මැටිවිලිය | 30 ඒ |
| | | ඉදිපලේගොඩ | 30 බී |
| | | දෙල්පොත | 30 සී |
| | | අමුගොඩ | 31 |
| | | තලගස්පෙ | 31 බී |
| | | දික්හේන | 31 සී |
| | | හිඹුටුගොඩ | 31 ඩී |
| | | කැල්ලපත | 31 ඊ |
| | | කැටැන්දොළ උඩෝවිට | 31 ජී |
| | | සිත්තරගොඩ | 31 එච් |
| | | තලගස්පෙ බටහිර | 31 ජේ |
| ගෝනාපීනුවල | ගෝනාපීනුවල | හික්කඩුව නැගෙනහිර | 59 ඒ |
| | | ආරච්චිකන්ද | 59ඒ/1 |
| | | ගෝනාපීනුවල නැගෙනහිර | 60 |
| | | ගෝනාපීනුවල බටහිර | 60 ඒ |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | හා අංකය |
|---|---|---|---|
| | | ගෝනාපීනුවල මධ්‍යම | 60 බී |
| | | වුඩ්ලන්ඩ්වත්ත | 60 සී |
| | | දොඩම්කහවිල | 60 ඩී |
| | | කළුවගහ ජනපදය | 60 ඊ |
| | | බේරතුඩුව | 66 බී |
| නියාගම | මත්තක | වැයිහේන | 32 |
| | | මාරතුපිටිය | 32 ඒ |
| | | කිඹුලාවල | 32 බී |
| | | මත්තක | 34 |
| | | බඹරවාන | 34 ඒ |
| | | පෝද්දිවල බටහිර | 34 බී |
| | | පෝද්දිවල නැගෙනහිර | 34 සී |
| | | ලියනගම කන්ද | 34 ඒ 1 |
| | | උස්බිම් ජනපදය | 34 ඒ 2 |
| බෝපෙ පෝද්දල | බෝපෙ | වටරැක නැගෙනහිර | 120 |
| | | මාම්පිටිය | 120 ඒ |
| | | වක්වැල්ල | 121 |
| | | හපුගල | 123 |
| | | නිලදෙණිය | 123 ඒ |
| | | පැලවත්ත | 123 බී |
| | | අබේසුන්දර වත්ත | 123 සී |
| | | බෙරලියදොල | 123 ඩී |
| | | කිතුලම්පිටිය | 124 |
| | | තුන්හිරිපාන | 124 ඒ |
| | | සිල්වගෙවත්ත | 124 බී |
| | | කහඳුවවත්ත | 124 සී |
| | | කලේගාන දකුණ | 125 |
| | | කලේගාන උතුර | 125 ඒ |
| | පෝද්දල | නරාවල | 111 |
| | | මගදෙනිය | 111 ඒ |
| | | පන්විල | 111 බී |
| | | වලවත්ත | 111 සී |
| | | බාස්වත්ත | 111 ඩී |
| | | අද්දරගොඩ | 111 ඊ |
| | | මුලන නැගෙනහිර | 111 එෆ් |
| | | මුලන බටහිර | 111 ජී |
| | | පෝද්දල | 117 එෆ් |
| | | මීපාවල | 117 ඒ |
| | | පන්නමග | 117 බී |
| | | පැණිදෙනිය | 117 සී |
| | | උළුවිටිකේ | 127 |
| | | ඕපාත | 127 බී |
| | | බොකරමුල්ලගොඩ | 127 සී |
| | | බංගලාවත්ත | 127 ඩී |
| කඩවත් සතර | ගාල්ල නාගරික | කුඹල්වැල්ල දකුණ | 96 |
| | | මහමෝදර | 96 ඒ |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | හා අංකය |
|---|---|---|---|
| කඩවත් සතර *(සම්බන්ධිතයි)* | | ගල්වඩුගොඩ | 96 බී |
| | | කළුවැල්ල | 96 සී |
| | | කොටුව | 96 ඩී |
| | | රිච්මන් කන්ද | 96 ඊ |
| | | කන්දෙවත්ත | 96 එෆ් |
| | | චීනකොරටුව | 96 ජී |
| | | මීනුවන්ගොඩ | 96 එච් |
| | | ඔසනගොඩ | 96 අයි |
| | | කුඹල්වැල්ල උතුර | 96 ජේ |
| | | කෝන්ගහ | 97 |
| | | වැලිවත්ත | 97 ඒ |
| | | මඩපාතල | 97 බී |
| | | පොකුණවත්ත | 97 සී |
| | | දංගෙදර නැගෙනහිර | 97 ඩී |
| | | මඩවලමුල්ල දකුණ | 98 |
| | | මඩවලමුල්ල උතුර | 98 ඒ |
| | | බටගන්විල | 98 බී |
| | | සංඝමිත්තපුර | 98 සී |
| | | දංගෙදර බටහිර | 98 ඩී |
| | | මාගාල්ල | 99 |
| | | තලාපිටිය | 99 ඒ |
| | | පෙට්ටිගලවත්ත | 99 බී |
| | | මකුළුව | 99 සී |
| | | දේවාතුර | 99 ඩී |
| | | කටුගොඩ | 100 |
| | | දෙවට | 100 ඒ |
| | | මාඉටිපේ | 101 |
| | | දෙද්දුගොඩ දකුණ | 101 ඒ |
| | | මිලිද්දුව | 101 බී |
| | | දෙද්දුගොඩ උතුර | 101 සී |
| | | වැලිපත | 101 ඩී |
| | | මලිගස්පෙ | 101 ඊ |
| | | දඩල්ල බටහිර | 102 |
| | | දඩල්ල නැගෙනහිර | 102 ඒ |
| | | වලව්වත්ත | 102 බී |
| | | සියඹලාගහවත්ත | 102 සී |
| | | ගිංතොට බටහිර | 103 |
| | | ගිංතොට නැගෙනහිර | 103 ඒ |
| | | වැලිපිටිමෝදර | 105 |
| | | කුරුඳුවත්ත | 106 |
| | | පියදිගම | 107 |
| | | බෝපේ උතුර | 107 ඒ |
| | | උක්වත්ත නැගෙනහිර | 108 |
| | | මහ හපුගල | 108 ඒ |
| | | උක්වත්ත බටහිර | 108 බී |
| | | බෝපේ බටහිර | 119 |
| | | බෝපේ නැගෙනහිර | 119 ඒ |
| | | ඇත්තිලිගොඩ දකුණ | 130 |

**රත්නපුර දිස්ත්‍රික්කය**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංක* | |
|---|---|---|---|
| ඇඹිලිපිටිය | මුල්ඇඩියාවල | මඩුවන්වෙල | 207 |
| | | ගඟේයාය | 207 ඒ |
| | | රංචමඩම | 207 බී |
| | | නින්දගම් පැලැස්ස | 207 සී |
| | | උඩවලව අංක 02 | 207 ඩී |
| | | දියපොට | 212 |
| | | සුදුගල | 212 ඒ |
| | | ජඳුර | 212 බී |
| | | වලල්ගොඩ | 213 |
| | | මුල්ඇඩියාවල | 213 ඒ |
| | | පනාමුර | 213 බී |
| | | තෝරකොළයාය | 213 සී |
| | | කෝන්කටුව | 213 ඩී |
| | මොදරවාන | උඩගම | 214 |
| | | කුඹුගොඩආර | 214 බී |
| | | මොරකැටිය | 214 සී |
| | | හිගුරආර | 214 ඩී |
| | | කැටගල්ආර | 214 ඊ |
| | | මොදරවාන | 214 එෆ් |
| | | කළගෙඩිආර | 214 අයි |
| | ඇඹිලිපිටිය නාගරික | ඇඹිලිපිටිය පල්ලේගම | 214ඒ |
| | | ඇඹිලිපිටිය නවනගරය | 214 ජී |
| | | යෝධගම | 214 එච් |
| බළංගොඩ | කල්තොට | කල්තොට | 258 |
| | | මැදබැද්ද | 258 බී |
| | | තන්ජන්තැන්න | 258 සී |
| | | නෙලුයාය | 258 ඊ |
| | | කුරගල | 258 එෆ් |
| | | උග්ගල්කල්තොට වම්ඉවුර වම | 259 |
| | | උග්ගල්කල්තොට වම් ඉවුර දකුණ | 259 ඒ |
| | | දියවින්න | 260 ඒ |
| | | වැලිපතයාය | 260 බී |
| | | කළුපේඩිගම | 260 ඊ |
| | | කෝන්ගහමංකඩ | 260 එෆ් |
| | රාස්සගල | රාස්සගල | 265 |
| | | වෙලේකුඹුර | 265 ඒ |
| | | පොල්වතුගොඩ | 265 බී |
| | | විජනත්කුඹුර | 265 සී |
| | | දුරකන්ද | 265 ඩී |
| | | එගොඩ වලේබොඩ | 266 |
| | දාමහන | දාමහන | 252 |
| | | බටුගම්මන | 252 ඒ |
| | | විකිළිය | 252 සී |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | හා අංක |
|---|---|---|---|
| | | තෙලදිරිය | 252 ඊ |
| | | ඉඹුලාමුර | 253 |
| | | මහවලතැන්න | 253 ඒ |
| | | මුල්ගම | 258 ඒ |
| | | වටවල | 258 බී |
| | | රජවක | 260 |
| | | මොලමුරේ | 260 සී |
| | | ගොඩකුඹුර | 260 ඩී |
| | | බෝවත්ත | 261 |
| | | අල්දොර | 261 ඒ |
| කලවාන | කුකුලේගම | කුකුලේගම උතුර | 195 |
| | | වැවගම | 195 ඒ |
| | | කුකුලේගම දකුණ | 195 බී |
| | | මීපාගම | 195 සී |
| | | පිටිගලකන්ද | 195 ඩී |
| | | කොඩිප්පිලිකන්ද | 195 ඊ |
| | | ජාතුවංගොඩ | 195 එෆ් |
| කහවත්ත | මඩලගම | පන්නිල | 226 |
| | | නැගෙනහිර මියනවිට | 226 බී |
| | | කිරණෝදාගම | 226 සී |
| | | ගබ්බෙල | 226 ඊ |
| | | බටහිර මියනවිට | 226 එෆ් |
| | | මඩලගම | 227 |
| | | යටාගර | 227 ඒ |
| | | ඇන්දාන | 227 බී |
| | | මඩලගම ජනපදය | 227 සී |
| | යායින්න | අටකලන්පන්න | 225 |
| | | පහමුණුපන්න | 225 ඒ |
| | | උතුරු පනාපිටිය | 226 ඒ |
| | | දකුණු පනාපිටිය | 226 ඩී |
| | | කලැල්ඇල්ල | 228 |
| | | නාඹුළුව | 228 ඒ |
| | | යායින්න | 229 |
| | | උඩහවුපේ | 229 ඒ |
| | | නැගෙනහිර නුගවෙල | 230 |
| | | වැල්ලඳුර | 230 ඒ |
| | | බටහිර නුගවෙල | 230 බී |
| | | බුංගිරිය | 230 සී |
| නිවිතිගල | කරවිට | පහළ කරවිට | 173 |
| | | වතුපිටිය | 173 ඒ |
| | | උඩකරවිට | 173 බී |
| | | හොරංගල | 173 සී |
| | | පිංකන්ද | 174 ඩී |
| | | දොළොස්වල කන්ද | 176 බී |
| | | දෙල්වල | 177 |
| | | පැබොටුව | 177 ඒ |
| | | පනහැටගල | 177 බී |
| | | හොරණෑකාර කන්ද | 177 සී |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංක | |
|---|---|---|---|
| කුරුවිට | කුරුවිට | පත්බේරිය | 127 |
| | | පරකඩුව | 127 ඒ |
| | | පත්බේරිය බටහිර | 127 බී |
| | | මෙනේරිපිටිය | 127 සී |
| | | තලාවිටිය | 146 |
| | | අමුහේන්කන්ද | 146 ඒ |
| | | බෝධිමළුව | 146 බී |
| | | පොහොරබාව | 148 |
| | | මියනදෙණිය | 148 ඒ |
| | | කුරුවිට | 155 |
| | | කිතුල්පෙ | 155 ඒ |
| | | පහළ කුරුවිට | 155 සී |
| | | පාතගම | 155 ඩී |
| | | තෙප්පනාව | 156 |
| | | ඉහළගම තෙප්පනාව | 156 ඒ |
| | | පහළගම තෙප්පනාව | 156 බී |
| | | ඕවිටිගම | 156 සී |
| | එක්නැලිගොඩ | වලඳුර | 154 |
| | | කාහේන්ගම | 154 ඒ |
| | | නඩුකාරදෙනිය | 154 බී |
| | | ගලුකාගම | 154 සී |
| | | කාහේන්ගම බටහිර | 154 ඩී |
| | | කොස්ගොඩ | 154 ඊ |
| | | දෙල්ගමුව | 155 බී |
| | | කදන්ගොඩ | 157 |
| | | කදන්ගොඩ දකුණ | 157 ඒ |
| | | පුස්සැල්ල | 158 |
| | | මිල්ලවිටිය | 158 ඒ |
| | | වතුයාය | 159 |
| | | උඩකඩ | 159 ඒ |
| | | එක්නැලිගොඩ උතුර | 159 බී |
| | | එක්නැලිගොඩ | 159 සී |
| | | කිරගල | 159 ඩී |
| අයගම | පරගල | උඩුගල | 193 ඒ |
| | | උඩුගල උතුර | 193 ඩී |
| | | පරාගල | 194 |
| | | පිඹුර | 194 ඒ |
| | | නිකගොඩ | 194 බී |
| | දුම්බර | ගලතුර | 190 |
| | | සිංහලගොඩ | 190 ඒ |
| | | මඩබද්දර | 190 බී |
| | | පහල ගලතුර | 190 සී |
| | | දුම්බර | 191 |
| | | කැටේපොල | 191 ඒ |
| | | දුම්බර මානාන | 191 බී |
| | | දෙතබඩකන්ද | 191 ඩී |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | හා අංක |
|---|---|---|---|
| පැල්මඩුල්ල | මාරපන | මාරපන | 179 |
| | | මාවුදැල්ල | 179 ඒ |
| | | පොත්තකන්ද | 179 බී |
| | | ගල්ලින්න | 179සී |
| | | පහල හකමුව | 180 |
| | | නිරල්ගම | 180 ඒ |
| | | ඉහල හකමුව | 180 බී |
| | | අළුපොත | 180 සී |
| ඉඹුල්පේ | ඉඹුල්පේ | ඉඹුල්පේ | 272 |
| | | පස්සරමුල්ල | 272 ඒ |
| | | අමුවතුගොඩ | 272 බී |
| | | මැදගෙදරගොඩ | 272 සී |
| | | අලුත්නුවර | 273 |
| | | තොටපල්ල | 273 ඒ |
| | | මාමල්ගහ | 273 බී |
| | | අමුපිටිය | 273 සී |
| | | සීලෝගම | 274 |
| | | කිංචිගුනේ | 275 |
| | | කුඹල්ගම | 275 ඒ |
| | | මුත්තෙට්ටුවේගම | 276 |
| | | පුවක්ගහවෙල | 276 ඒ |
| | | කරගස්තලාව | 276 බී |
| | | හල්පේ | 277 |
| | | බුදුන්වෙල | 277 ඒ |
| | | නිත්තමලුව | 277 බී |
| | | ඉහලගලගම | 278 |
| | | විහාරවෙල | 278 ඒ |
| | | බෙලිහුල්ඔය | 279 |
| | | කුඹුරුතැනිවෙල | 279 ඒ |
| | | යක්දෙහිවල | 279 බී |
| රත්නපුර | ගිලීමලේ | උතුරු ගිරිමලේ | 162 |
| | | කුඩාව | 162 ඒ |
| | | ශ්‍රී පලාබද්දල | 162 බී |
| | | සිරිපාගම | 162 සී |
| | | ඇඹුල්දෙණිය | 162 ඩී |
| | | කැටවල | 162 ඊ |
| | | රත්ගම | 162 එෆ් |
| | | ගුරුළුවාන | 162 ජී |
| | | මාපලාන | 162 එච් |
| | | දකුණු ගිරිමලේ | 163 |
| | | මල්වල | 163 ඒ |
| | | මීහිටිය | 163 බී |
| | | එගොඩ මල්වල | 163 සී |
| | | පාගොඩ | 163 ඩී |
| | | දුරෙක්කන්ද | 163 ඊ |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *හා අංක* |
|---|---|---|---|
| රත්නපුර | රත්නපුර නාගරික | දේවාලෙගාව | 151 |
| | | කැටලියන්පල්ල | 151 ඒ |
| | | කහංගම | 151 බී |
| | | ගොඩිගමුව | 152 |
| | | රත්නපුර නගරය | 152 ඒ |
| | | වෙරළුප | 152 බී |
| | | මහවල | 152 සී |
| | | මිහිඳුගම | 152 ඩී |
| | | රත්නපුර නගර උතුර | 152 ඊ |
| | | රත්නපුර නගර බටහිර | 152 එෆ් |
| | | ඇල්ලේගෙදර | 153 |
| | | නවනගරය | 153 ඒ |
| | | මලංගම | 153 බී |
| | | අමුතාගොඩ | 153 සී |
| | | කොස්පැලවින්න | 153 ඩී |
| | | බටුගෙදර | 181 |
| | | තිරිවානාකැටිය | 181 බී |
| | | අංගම්මන | 181 සී |
| | | මුවගම | 182 |
| | | මුද්දුව | 182 ඒ |
| | | සමගිපුර | 182 සී |
| | | මුද්දුව නැගෙනහිර | 182 ඩී |
| | | ඇත්ඔය | 182 ඊ |
| වැලිගෙපොල | මුත්තෙට්ටුපොල | මුත්තෙට්ටුපොල | 219 |
| | | ගල්පාය | 219 බී |
| | | මඩවලලන්ද | 219 සී |
| | | බඹරගල | 219 ඩී |
| | | පුස්සෙතොට | 219 එෆ් |
| | | බදුල්ලෙගම | 220 |
| | | එලමල්පෙ | 220ඒ |
| | | කලටුවකන්ද | 220 බී |
| | | තැන්නහේන | 220 සී |
| | | රංවල | 221 |
| | | අම්මඩුව | 221 බී |
| | | උඩරංවල | 221 සී |

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* | *හා අංක* |
|---|---|---|---|
| මුතූර් | මුතූර් 01 | තෝප්පූර් | 216 |
| | | අල්ලිනගර් නැගෙනහිර | 216 ඒ |
| | | ඉක්බාල් නගර් | 216 බී |
| | | පාලතෝප්පූර් | 216 සී |
| | | අල්ලිනගර් බටහිර | 216 ඊ |
| | | පල්ලිකුඩියිරුප්පු | 219 |
| | | නල්ලූර් | 219 ඒ |
| | | පඩ්ඩාලිපුරම් | 219 බී |
| | | සාම්පූර් නැගෙනහිර | 220 |
| | | සාම්පූර් බටහිර | 220 ඒ |
| | | කුනිතීවු | 221 |
| | | නවරත්නපුරම් | 221 ඒ |
| | | කට්ටෙයිපරිච්චාන් දකුණ | 222 |
| | | චේනයියූර් | 222 ඒ |
| | | කට්ටෙයිපරිච්චාන් උතුර | 222 බී |
| | | කඩක්කරෙයිචේනෙයි | 222 සී |
| | | මුතූර් නැගෙනහිර | 223 ඒ |
| | | තක්වා නගර් | 223 සී |
| | | නීදල් නගර් | 223 ඩී |
| | | නඩුත්තීව් | 223 ඊ |
| | | මුතූර් මධ්‍යම | 223එෆ් |
| | | පාල නගර් | 223 ජී |
| | | ආලිම් නගර් | 224 බී |
| | | තාහා නගර් | 224 සී |
| | | ජින්නා නගර් | 224 ඊ |
| | මුතූර් 02 | ජින්නා නගර් | 216 ඩී |
| | | මල්ලිකෙයිතීවු | 218 |
| | | කිලිවෙඩ්ඩි | 218 ඒ |
| | | පට්ටිතිඩාල් | 218 බී |
| | | කන්ගුවෙලි | 218 සී |
| | | පෙරුවෙල්ලි | 218 ඩී |
| | | ඉරුදයපුරම් | 218 ඊ |
| | | පලතඩිචේනෙයි | 218එෆ් |
| | | භාරතීපුරම් | 218 ජී |
| | | අස්සාත් නගර් | 218 එච් |
| | | මෙන්කාමම් | 218 අයි |
| | | මුතූර් බටහිර | 224 |
| | | පෙරියපාලම් | 224 ඒ |
| | | රාල්ගුල්ලි | 224 ඩී |
| | | ෂාපි නගර් | 224එෆ් |
| | | ඡායා නගර් | 224 ජී |

07-900

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ "මුදල් පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්" වේ. "සේවය" යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂීකොට සඳහන් කර නොමැති අවස්ථාවන්හිදී " ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය" වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

*ලිඛිත විභාගය.-* මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත වේ.

(i) අවබෝධය.
(ii) බුද්ධි පරීක්ෂණය.
(iii) සාමාන්‍ය දැනීම.

*විභාග දිනය.-*මෙම විභාගය නොවැම්බර් මස කොළඹ නගරයේදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය.-*රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, ලිඛිත විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම ලකුණු 40%ක් හෝ 40% ට නොඅඩුව ලබා ගන්නා අපේක්ෂකයන් අතුරින් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත.

3. පත්කරනු ලබන සංඛ්‍යාව 30 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. සේවා කොන්දේසි.-

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක : 1804/50 සහ 2013.04.05 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම ස්ථිර කරන ලද නිලධාරියෙකු පත්කරනු ලැබුවහොත් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්වනු ඇත. ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

5. *වැටුප් පරිමාණය.-*2016.02.25 දිනැති අංකඃ 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 47,615-10x1,335-8x1,630-17x2,170-රු.110,895/-(SL-01-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. (උදාඃ 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා අදාළ වනුයේ රු.27,871/- ක මූලික වැටුපක් හා රු. 9,651/- ක ගැලපුම් දීමනාවකි.)

6. බඳවා ගැනීමේ සුදුසුකම් ඃ

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුවීම;
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්තවීම;
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් කායික හා මානසික හා අන් සෑම අයුරකින්ම යෝග්‍ය තාවයකින් යුක්තවීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම්ඃ

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන පළවන හෝ දෙවන පන්තියේ පන්ති සාමාර්ථයක් සහිත උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකුවීම;

*හෝ*

(iii) වරලත් ගණකාධිකාරිවරයෙකුවීම.

සටහන - I/II/III සුදුසුකම් බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.

(*ඈ*) *වයස* :

අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසිදෙකට (22) නොඅඩු විය යුතු අතර, අවුරුදු විසිඅටට (28) නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1994.08.25 දින හෝ ඊට පෙර හා 1988.08.25 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස අවුරුදු 35 වේ.

(*ඇ*) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

(i) විවෘත තරඟ විභාගය සඳහා වාර දෙකකට (02) වඩා පෙනී සිටීමට කිසිම අයදුම්කරුවකුට අවසර නොමැත. (පෙර සේවා ව්‍යවස්ථාව යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ II/II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කරගනු නොලැබේ.)

(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) යම් ආගමක පූජකවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

7. *විභාග ගාස්තු* .- විභාගය සඳහා වූ ගාස්තුව රුපියල් 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. තැපැල් කාර්යාලයෙන් ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම යෝජනවත් විය හැකිය.විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

8. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2"× 12 " (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. 1.0 සිට 2.12 තෙක් වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමුවන පිටුවේද, 3.0 සිට 6.0 තෙක් එහි දෙවෙනි පිටුවේද,ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතුය.

(*ඇ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2016 අගෝස්තු 25 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016" ලෙස විභාගයේ නම ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාග යේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ඈ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු. ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,40,360 කට (6 - 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ I උප ලේඛනය අනුව මාසිකව රු. 41,580 කට) වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන්ගේ අත්සන තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සහතික කරනු ලැබිය යුතුය.

(*ඉ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාල ලදුපතේ පිටපත හා අයදුම්පත්‍ර තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. *විභාගයට ඇතුළුවීම* :

(*අ*) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද (අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද) සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන* - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත:

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් - අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

(*අ*) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(*ආ*) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය හෝ වෘත්තීය සුදුසුකම ලබාගත් භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතු ය.

(*ඇ*) අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේදී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(*ඈ*) ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන* :-

(i) ඉහත (*ආ*) සහ (*ඇ*) හි ඇති සුදුසුකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6 (ආ) ඡේදයේ ඇති උපාධි හෝ වෘත්තීය සුදුසුකම් වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(iii) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

14. බඳවා ගැනීමේ ක්‍රමය -

14.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| | *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අවබෝධය | 100 | 40 |
| 2 | බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| 3 | සාමාන්‍ය දැනීම | 100 | 40 |

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

14.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.

(iii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් හතලිහක් (40) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියළුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබාගත් කුසලතා අනුපිළිවෙල හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යා අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත පරිදි තීරණය කරනු ලබන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

*සැළකිය යුතුයි:*
සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගිවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ.

14.3 පුරප්පාඩු සංඛාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේදී සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු ප්‍රමාණය අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙලින් මෙම සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

14.4 ප්‍රතිඵල :

*ගැසට් නිවේදනයේ* 14.1 ඡේදයට අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයින් විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස්කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල

පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

15. ලිඛිත විභාගයේ විෂය නිර්දේශයː-

**විෂය අංක 01 - අවබෝධයː**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.

*I වැනි කොටස :*

මෙම කොටසට රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ.

*II වැනි කොටස :*

භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨ කිහිපයකින් දෙවෙනි කොටස සමන්විත වේ. මෙම පාඨ ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගේ අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳ විචාරණාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්ප ඛාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු කිහිපයක් අතරින් නිවැරදි පිළිතුර තෝරා දක්වන ලෙස හෝ අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(කාලය පැය 2 යි, ලකුණු 100)

**විෂය අංක 02 - බුද්ධි පරීක්ෂණය :**

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළැඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(කාලය පැය 1 යි, ලකුණු 100)

**විෂය අංක 03 - සාමාන්‍ය දැනීම:**

මෙම ප්‍රශ්න පත්‍රය සම්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්ත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව අපේක්ෂකයා තුළ ඇති දැනීම පිරික්සීම සඳහා ය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(කාලය පැය 3 යි, ලකුණු 100)

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 ජූලි මස 01 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

---

ආදර්ශ අයදුම්පත

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016**

**Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Inland Revenue Service - 2016**

ඉල්ලුම්පත්‍රය

1.0 මාධ්‍ය-

විභාගයට පෙනී සිටින
භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(*උදාහරණ* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.)

2.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(*උදා.* : GUNAWARDHANA H. M. S.K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය :-
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1 ☐

2.7 විවාහක/අවිවාහක බව :-
අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2 ☐

2.8 ජන වර්ගය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4, වෙනත් - 5) ☐

2.9 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.10 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

2.11 සුදුසුකම් සැපිරිය යුතු 2016.08.25 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

2.12 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 (i) උපාධිය/වෘත්තීය සුදුසුකම ලද දිනය :————.
(ii) විශ්ව විද්‍යාල/ආයතනය :————.
(iii) ලියාපදිංචි වූ අංකය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.
(v) උපාධිය/වෘත්තීය සුදුසුකම :————.
(vi) විෂයයන්/විෂයය ක්ෂේත්‍රය :————.
(vii) පන්තිය :————.
(viii) ඉහළ/පහළ :————.
(ix) විභාග අංකය :————.
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

4.0 රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන්

(i) දැනට දරන තනතුර හෝ සේවය :————.
(ii) ශ්‍රේණිය :————.
(iii) එම තනතුරට බැඳුනු දිනය :————.
(iv) තනතුරෙහි ස්ථිර කරන ලද දිනය :————.
(v) සේවා කාලය :————.

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :-

(ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.)
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ....................හා .......................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ* 8 (ඈ) පරිදි විය යුතු ය.)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .................................................................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, .......................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

———,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :———.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

8.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .................................................. (සම්පූර්ණ නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ........................................................... සේවයේ .......... ශ්‍රේණියේ ස්ථිර තනතුරක සේවය කරන බවත්, ඔහු/ඇය මොනම ආකාරයක විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.)

දිනය :———.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

07-934

## ජාතික සමාජ සංවර්ධන ආයතනය
## (සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය)

සංඥා භාෂා පරිවර්තක එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව
Diploma in Sign Language Interpreter - 2016
සිංහල මාධ්‍යය

ජාතික සමාජ සංවර්ධන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A යටතේ අනුමත උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයකි.

*ඇතුළත්වීමේ සුදුසුකම් :*

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය හා සිංහල හෝ ඉංග්‍රීසි හෝ දෙමළ යන විෂයන්ගෙන් එක් විෂයකට සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 කින් සමත් වීම සහ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03 ක් සහිතව සමත් වීම.
- සමෘද්ධිලාභී පවුලක සාමාජිකයකු විය යුතුය.
- වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

*පාඨමාලා අන්තර්ගතය :*

1. සංඥා භාෂාව පිළිබඳ දැනුම
2. පරිවර්තන ක්‍රමවේදය
3. ආචාර ධර්ම පද්ධතිය
4. ක්ෂේත්‍ර පුහුණුව

ඔබ මෙම පාඨමාලාව තෝරාගත යුත්තේ ඇයි?

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විද්‍යුත් මාධ්‍යයන්හි සේවයේ නිරත වීමට අවශ්‍ය වෘත්තීය පුහුණුකරුවෙකු වීමට.
- සංඥා භාෂාව පිළිබඳ ක්ෂේත්‍රයේ පුහුණුකරුවෙකු වීමට.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල ගුණාත්මක සේවාවක් සඳහා.

ඔබ ඒ සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනය තෝරාගත යුත්තේ ඇයි?

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශට අයත් ජාතික සමාජ සංවර්ධන ආයතනය 1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත රජයේ උසස් අධ්‍යාපන ආයතනයකි. එය සමාජ වැඩ, උපදේශනය හා සමාජ සංවර්ධනය උදෙසා අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනයයි.

| | | |
|---|---|---|
| කාලය | : | අවුරුදු 01 (සතියට දින 03) |
| මාධ්‍යය | : | සිංහල |
| ආරම්භය | : | 2016 සැප්තැම්බර් |
| පාඨමාලා ගාස්තුව | : | නොමිලේ |

පාඨමාලාවට තෝරාගනු ලබන පාඨමාලා ලාභීන්හට පාඨමාලා කාලසීමාව තුළදී මසකට රුපියල් 2,500 ක දීමනාවක් ගෙවනු ලැබේ.

*පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ යුතු ආකාරය :*

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත්‍රයක් 2016.07.31 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලිපියේ වම්පස ඉහළ කෙළවරේ " සංඥා භාෂා පරිවර්තක එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව - 2016" යනුවෙන සඳහන් විය යුතු ය.

ලේඛකාධිකාරී,
ජාතික සමාජ සංවර්ධන
ආයතනය,
අංක. 488 ඒ, නාවල පාර,
රාජගිරිය.

*වැඩි විස්තර සඳහා*
දුරකථන අංකය : 0112882506-07
වෙබ් අඩවිය : www.nisd.lk
ෆැක්ස් : 0112882502

07-961

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2016

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමණාකාර සහකාර සේවයේ අධිකරණ ලඝුලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

03. *වැටුප් ක්‍රමය* .- මසකට රු. 28,940 - 10x300 - 11x350 - 10x560 - 10x660 - රු. 47,990 - වැටුප් ප්‍රමාණයක් මෙම තනතුරට අයත්ය. මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර රු. 28,940 ක් වේ. (2020.01.01 දින දක්වා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛන II හි පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

04. *වයස*.-අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි. (රජයේ සේවයේ නියුතු නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ)

05. *අධ්‍යාපන සුදුසුකම් :*

අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. අ.පො.ස. (සා.පෙළ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු අතර සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 05 කට සම්මාන සාමාර්ථයන් ලබා තිබීම සහ ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව

හා පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලඝුලේඛන හා යතුරු ලියනය (සිංහල/දෙමළ) පාඨමාලාවක් සාර්ථකව හදරා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර අවසන් කර තිබිය යුතු ය.

06. අයදුම්කරුවන් සඳහා විභාගයක් පවත්වනු ලබන අතර එම විභාගයේ ප්‍රතිඵල මත නියමිත ලකුණු මට්ටමට එළඹ ඇති තැනැත්තන් වාචික පරීක්ෂණයකින් පසු බඳවා ගනු ලැබේ. එලෙස තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සේවයට බඳවා ගැනීමෙන් පසු දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

07. නිර්දේශ පත්‍රය :

(අ) සිංහල/දෙමළ භාෂාව හා වාක්‍ය රචනය

(ආ) (සිංහල/දෙමළ) ලඝු ලේඛනය - විනාඩියකට වචන 70ක වේගයෙන් විනාඩි 05ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝුලේඛනය කර, එය විනාඩියකට වචන 08ක වේගයෙන් පිටපත් කිරීම.

(ඇ) සිංහල/දෙමළ යතුරු ලිවීම - විනාඩියකට වචන 30ක අවම වේගයෙන් විනාඩි 20ක් යතුරු ලිවීම.

(ඈ) වාචික පරීක්ෂණය

*සටහන* .- උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී පිරිසිදුකම හා නිරවද්‍යතාවය සැළකිල්ලට ගනු ලැබේ.

08. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පල කර ඇත. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. විභාගය සඳහා අයදුම් කිරීමේ දී පරිපාලන ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රු. 500 ක මුදලක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් නමින් මහජන බැංකුවේ වෙල්ල වීදිය ශාඛාවේ පවත්වා යන ගිණුම් අංක : 297100199025039 බැර කර ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත කොටුවේ ඇලවිය යුතු වේ.

09. අයදුම්පත් 2016 අගෝස්තු 26 වන දිනට හෝ එදිනට පෙර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය, කොළඹ 12 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. රජයේ සේවයේ නියුතු නිලධරයන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු වේ.

10. අයදුම්පත සම්බන්ධව පැන නගින ගැටලු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

ප්‍රදීප් ජයතිලක,<br>
ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2016 ජූනි මස 30 වැනි දින,<br>
කොළඹ 12.<br>
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

***අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ) III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016***

| | |
|---|---|
| අයදුම් කරන මාධ්‍යය<br>සිංහල මාධ්‍යය - 01<br>දෙමළ මාධ්‍යය - 02 | |

| |
|---|
| විභාග අංකය :<br><br>(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි) |

(***සැළකිය යුතුය*** - අයදුම්පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුවේ. අදාළ කොටුවල නියමිත අංකය සඳහන් කරන්න)

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම :—————. මයා/මිය/මෙය.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

02. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී 01 / පුරුෂ 02 [ ]

03. ස්ථිර ලිපිනය :—————.

04. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.

05. පදිංචි දිස්ත්‍රික්කය :————.

06. දුරකථන අංකය : | | | | | | | | | | |

07. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

08. (*අ*) උපන් දිනය :————.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

09. රජයේ සේවයේ නියුක්ත නම්,
- (i) අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :————.
- (ii) දැනට දරන තනතුර :————.
- (iii) එම තනතුරට පත් කරන ලද දිනය :————.
- (iv) එම තනතුරේ ස්ථිර කරන ලද දිනය :————.
- (v) කාර්යාලයීය ලිපිනය :————.

10. අධ්‍යාපන සුදුසුකම් :
(එක් එක් විභාගයේ ප්‍රතිඵල විභාග අංකය සහිතව වෙන් වෙන්ව සඳහන් කරන්න).

(*අ*) අ.පො.ස. (සා.පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————. වර්ෂය :————. විභාග අංකය :————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

(*ආ*) අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

(*ඇ*) හදාරා ඇති පාඨමාලාව පිළිබඳ විස්තර : (*ගැසට් පත්‍රයෙහි* 05 වගන්තිය අනුව ඇතුළත් කරන්න)

..............................................................................................................

*සටහන* : අයදුම්කරුවන් විසින් චක්‍රලේඛයේ සටහන් උපදෙස් පරිදි නියමිත වටිනාකම තැන්පත් කර ලබාගත් රිසිට් පත ගැළවිය නොහැකි පරිදි මෙහි අලවන්න.

| |
|---|
| |

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවත්, මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිපැදීමට එකඟවන බවත් ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බැව් මා දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

නම :—————.

නිල මුද්‍රාව :—————.

07-938

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.